
# දෑතේ කරගැට සිඹ සනසන්නට


## සිංහල සාහිත්‍ය සංග්‍රහය

### 10 ශ්‍රේණිය - III වාරය

- නිපුණතාව - 14.0 - සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- නිපුණතා මට්ටම - 14.5 - නූතන පද්‍ය සාහිත්‍ය විචාර රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

- ඉගෙනුම් පල - ★ කාව්‍ය නිර්මාණයට පාදක වූ අත්දැකීම් හඳුනාගෙන විස්තර කරයි.
  - ★ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ අගය කරයි.
  - ★ දෑතේ කරගැට නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.








මහගම සේකර

<u>ක්‍රියාකාරකම - 1</u>

★ කෙටි පිළිතුරු සපයන්න.

1. මහගම සේකර මහතාගේ උපන් ප්‍රදේශය කුමක් ද ?
2. ඔහුගේ වෘත්තීය ජීවිතයේ සන්ධිස්ථාන මොනවා ද ?
3. සේකරයන්ගේ කුසලතා ප්‍රකට වූ ක්ෂේත්‍ර මොනවා ද ?
4. ඔහුගේ කාව්‍ය සංග්‍රහයන් හයක් නම් කරන්න.
5. සේකරයන් අතින් රචනා වූ නවකතා දෙක නම් කරන්න.
6. ඔහු අධ්‍යක්ෂණය කළ චිත්‍රපටය කුමක් ද ?
7. ඔහු නිර්මාණය කළ නාට්‍ය මොනවා ද ?
8. මහගම සේකරයන්ගේ ආචාර්ය උපාධි නිබන්ධයේ නම කුමක් ද ?
9. ඔහු ලද ආචාර්ය උපාධියේ විශේෂත්වය කුමක් ද ?
10. “ දෑතේ කරගැට ” නිර්මාණය පළ වී තිබුණේ කිනම් කෘතිවල ද ?

## ක්‍රියාකාරකම - 2

★ සුදුසු සමාන පද පාඩමෙන් සොයා ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. සුළං | - ---------------------------------- | 2. වර්ෂා | - ---------------------------------- |
| 3. චන්ද්‍රයා | - ---------------------------------- | 4. ක්ෂීර | - ---------------------------------- |
| 5. වාපි | - ---------------------------------- | 6. මාතෘ භූමියේ | - ---------------------------------- |
| 7. දෙනෙත් | - ---------------------------------- | 8. නිරිඳු | - ---------------------------------- |
| 9. දිය උල්ල | - ---------------------------------- | 10. වැඩෙන | - ---------------------------------- |
| 11. ස්වේද | - ---------------------------------- | 12. අර්ධ | - ---------------------------------- |
| 13. ගුවනින් | - ---------------------------------- | 14. ස්වප්නයෙන් | - ---------------------------------- |
| 15. සමූහයා | - ---------------------------------- | 16. මැණික් වලින් | - ---------------------------------- |
| 17. සූර්යාලෝකය | - ---------------------------------- | 18. ශරීර විඩාව | - ---------------------------------- |
| 19. පලු | - ---------------------------------- | 20. බිහිවී | - ---------------------------------- |

## ක්‍රියාකාරකම - 3

★ සුදුසු පිළිතුරට අදාළ අංකය [ ආ ] කොටසින් සොයා ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

[ අ ]

1. උත්ප්‍රේක්ෂාලංකාරය සහිත යෙදුමකි. [ ]
2. රූපකාලංකාරයකි. [ ]
3. සංකේතයකි [ ]
4. ව්‍යංග්‍යාර්ථවත් යෙදුමකි. [ ]
5. අනුප්‍රාසාත්මක යෙදුමකි [ ]
6. දරු සෙනෙහස ප්‍රකාශිත යෙදුමකි [ ]
7. ජාතිකාභිමානය දනවන යෙදුමකි. [ ]
8. ශ්‍රමාභිමානය දනවන යෙදුමකි. [ ]
9. උතුම්ම අපේක්ෂාවක් සහිත යෙදුමකි. [ ]
10. කෘෂි ජීවිතයට සම්බන්ධ යෙදුමකි. [ ]

[ ආ ]

1. හෙට ඉදිවන නව ලෝකය දැක දැක
2. ළා ගොයමේ දලු පවන් සලයි.
3. ඔබහට ලෝකය ඉදිකර දී මිස යා නොහැකිය.
4. ගත වෙහෙසම සතුටක් වෙයි මට ඔබ සිහිවන විට පුංචි පුතුන්
5. දහදිය මුතු ඇට මල් වරුසා වී
6. කරල් බරින් පීදි වැගිරෙයි

7. දහදිය මුතු ඇට
8. හෙට හිරු එළියට වඩින දිනේ
9. දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල යළි ඉපදී ඇත මව් දෙරණේ
10. පුංචි පුතා හීනෙන් හිනැහෙයි.

<u>ක්‍රියාකාරකම - 4</u>

★ ප්‍රශ්නයට අදාළ පිළිතුර කොටුවලින් තෝරා හිස්තැන මත ලියන්න.

1. ළා ගොයමේ දලු පවන් සලන්නේ මොනවාට ද ?

-----------------------------------------------------------------------------------------------------------

2. දහදියට සිදුවන්නේ කුමක් ද ?

-----------------------------------------------------------------------------------------------------------

3. " හඳ මාමේ හඳ මාමේ කිරිත් පැණිත් දියෝ " යන ළමා කවිය සිහි ගන්වන දෙපදය උපුටා දක්වන්න.

-----------------------------------------------------------------------------------------------------------

4. පුංචි පුතා හීනෙන් හිනැහෙන්නේ කුමක් දැකීමෙන් ද ?

-----------------------------------------------------------------------------------------------------------

5. යළි ඉපදී ඇත්තේ කවුරුන් ද ?

-----------------------------------------------------------------------------------------------------------

6. නිධානවල තිබෙන්නේ මොනවා ද ?

-----------------------------------------------------------------------------------------------------------

7. පුංචි පුතු රජ කරනුයේ කුමන යුගයකදී ද ?

-----------------------------------------------------------------------------------------------------------

8. ශරීර වෙහෙස සතුටක් වන්නේ කෙසේ ද ?

-----------------------------------------------------------------------------------------------------------

9. කථකයා දුටු සිහිනය කුමක් ද?

-----------------------------------------------------------------------------------------------------------

10. ඔහුගේ අරමුණ කුමක් ද ?

-----------------------------------------------------------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| අනාගත ලෝකය | පුතුට යහපත් අනාගතයක් සකස් කිරීම | | අඩසඳ මෝරන මැදියම් අහසින් බිළිඳු හදට කිරි දියර ගලයි |
| සත් රුවන් | දැතේ කරගැටවලට | පුතු සිහිවන විට | |
| පුංචි පුතුන් | පුරාණ වැව් ඉදිකළ යෝධයෝ | මල් වර්ෂාවක් වෙයි | නිවහල් |

ක්‍රියාකාරකම - 5

★ පහත සඳහන් අදහස් ප්‍රකාශ වන පද්‍ය පාද සොයා ලියන්න.

1. රන්වන් කරල් පීදී ඇත්තේ දහදිය මල් වැස්සක් මෙන් වැටුණු හෙයිනි.

-------------------------------------------------------------------------------------------------------------------

2. නින්දෙන් හිනැහෙන්නේ අනාගතයේ ඔහු වෙනුවෙන් ඉදිවන ලෝකය සිහිනයෙන් දැකීම නිසා ය.

-------------------------------------------------------------------------------------------------------------------

3. පුරාණ වැව් බැඳි යෝධයෝ වර්තමානයේ ද ජීවත් වෙති.

-------------------------------------------------------------------------------------------------------------------

4. ණයෙන් හෝ බියෙන් තොර නිදහස් දේශයක් අනාගත පරපුරක් වෙනුවෙන් ඉදි කළ යුතුව ඇත.

-------------------------------------------------------------------------------------------------------------------

5. පුංචි පුතු මතක් වන විට ශරීර වෙහෙස දුරුවෙයි.

-------------------------------------------------------------------------------------------------------------------

6. වැඩිහිටි පරපුරේ ඒකායන අපේක්ෂාව අනාගත පරපුරට සුන්දර දේශයක් ඉදි කිරීමයි.

-------------------------------------------------------------------------------------------------------------------

7. ළදරුවන්ගේ සිත් සතුටු වෙයි.

-------------------------------------------------------------------------------------------------------------------

8. ශරීර වෙහෙස දුරු කරගනු පිණිස ජලදහරාවක් වන්නේ පුංචි පුතුගේ ආදරයයි.

-------------------------------------------------------------------------------------------------------------------

9. අනාගත ලෝකය සුන්දර වීමේ අපේක්ෂාවෙන් වර්තමානයේ දුක් පීඩා දරා ගනිමි.

-------------------------------------------------------------------------------------------------------------------

10. ඉතිහාසය පුරාම අනාගත පරපුරට සුවසෙත සලසන ලද්දේය.

-------------------------------------------------------------------------------------------------------------------

ක්‍රියාකාරකම - 6

★ " දැතේ කරගැට ...... " නිර්මාණයෙන් ජාතිකාභිමානයත් ශ්‍රමාභිමානයත් ඉස්මතු කෙරේ. විමසන්න.

[ ඒ සඳහා පහත සඳහන් විචාර සැකිල්ල ඔබට භාවිත කළ හැකිය. ]

1. ප්‍රවේශය
2. විග්‍රහය - ★ නිර්මාණයෙන් ඉස්මතු වන
   - Í ජාතිකාභිමානය -
     - දෙදහස් පන්සිය වසරක් තිස්සේ.........
     - දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල .........
   - ÍÍ ශ්‍රමාභිමානය -
     - දැතේ කරගැට සිඹ සනසන්නට .........
     - මා ගත වෙහෙසට ආදරයෙන් .........
3. නිගමනය

## පිළිතුරු

### ක්‍රියාකාරකම - 1

1. රදාවන [ ගම්පහ දිස්ත්‍රික්කය ]
2. ගුරුවරයෙක් , ගුරු විද්‍යාල කථිකාචාර්යවරයෙක් , පුවත්පත් කලාවේදියෙක් , ගුවන් විදුලි ශිල්පියෙක්
3. කාව්‍ය , නවකතා , කෙටිකතා , චිත්‍රපට , ගේය පද , නාට්‍ය
4. හෙට ඉරක් පායයි , මක් නිසාද යත් , බෝඩිම , සක්වා ළිහිණි , නොමියෙමි , ප්‍රබුද්ධ
5. තුංමංහංදිය , මනෝ මන්දිර
6. තුංමංහංදිය
7. කුණ්ඩලකේසී , සද්දන්ත , හංසගීතය
8. සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ
9. ආචාර්ය උපාධිය පිරිනමන විට සේකරයෝ අභාවප්‍රාප්ත ව සිටියහ.
10. ★ ප්‍රබුද්ධ
    ★ මහගම සේකරයන්ගේ නොපළ ගීත

### ක්‍රියාකාරකම - 2

| | |
|---|---|
| 1. පවන් | 2. වරුසා |
| 3. සඳ | 4. කිරි |
| 5. වැව් | 6. මවු දෙරණේ |
| 7. දෑසේ | 8. රජ |
| 9. දිය උල්පත | 10. මෝරන |
| 11. දහදිය | 12. අඩ |
| 13. අහසින් | 14. හීනෙන් |
| 15. කැල | 16. රුවනින් |
| 17. හිරු එළිය | 18. ගත වෙහෙස |
| 19. දලු | 20. ඉපදී |

### ක්‍රියාකාරකම - 3

| | |
|---|---|
| 1. [ 2 ] | 2. [ 7 ] |
| 3. [ 10 ] | 4. [ 8 ] |
| 5. [ 1 ] | 6. [ 4 ] |
| 7. [ 9 ] | 8. [ 5 ] |
| 9. [ 3 ] | 10. [ 6 ] |

ක්‍රියාකාරකම - 4

1. දෑතේ කරගැටවලට
2. මල් වර්ෂාවක් වෙයි
3. අඩ සඳ මෝරන මැදියම් අහසින්
   බිලිඳු හදට කිරි දියර ගලයි
4. අනාගත ලෝකය
5. පුරාණ වැව් ඉදි කළ යෝධයෝ
6. සත්රුවන්
7. නිවහල්
8. පුතු සිහිවන විට
9. පුංචි පුතුන්
10. පුතුට යහපත් අනාගතයක් සකස් කිරීම.

ක්‍රියාකාරකම - 5

1. දහදිය මුතු ඇට මල් වරුසා වී
   කරල් බරින් පීදී වැගිරෙයි
2. හෙට ඉදිවන නව ලෝකය දැක දැක
   පුංචි පුතා හීනෙන් හිනැහෙයි.

3. දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
   යළි ඉපදී ඇති මව් දෙරණේ
4. ණය නැති බිය නැති නිවහල් යුගයක
   පුංචි පුතා රජ කරනු පෙනේ.

5. ඒ ගත වෙහෙසට සතුටක් වෙයි මට
   ඔබ සිහි වන විට පුංචි පුතුන්
6. ඔබ යට ලෝකය ඉදිකර දී මිස
   යා නොහැකිය මට පුංචි පුතුන්

7. බිලිඳු හදට කිරි දියර ගලයි
8. මා ගත වෙහෙසට ආදරයෙන් දිය
   උල්පත පාදන පුංචි පුතුන්

9. දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
   හෙට හිරු එළියට වඩින දිනේ
10. දෙදහස් පන්සිය වසරක් තිස්සේ
   මා දුටු සිහිනය පුංචි පුතුන්

ක්‍රියාකාරකම - 6

★ දී ඇති සැකිල්ලට අනුව වචන 150කට නොඅඩු විචාරයක් ලියා තිබිය යුතුයි.